**ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සමාජසේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව වත්කම් රු.139,818,456 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස රු.341,589,114 ක් ගිණුම්වලට ඇතුළත් කිරීම හේතුවෙන් රු.201,771,456 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය නොවන වත්කම් ශේෂයන් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. | වර්ෂය තුලදී CIGAS වැඩසටහනට ඇතුලත් කල ආරම්භක ශේෂ වල එකතුව 2018.12.31 දින පැවති ශේෂයට එකතුවීමෙන් 2019.01.01 ශේෂය සෑදී ඇත. 2020.12.31න් පසු ආරම්භක ශේෂ CIGAS වැඩසටහනට ඇතුලත් කල නොහැකි බැවින් මෙම දෝෂය 2021 වසරෙන් පසු නිවැරදි වීමට නියමිත වේ. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් විස්තර අනුව (ඒසීඒ 5) අත්තිකාරම් ලැබීම් රු.20,885,578 ක් වුවද, දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ලැබීම් රු.22,473,336 ක් වී තිබුණි. ඒ අනුව රු.1,587,758 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | ශේෂ පිරික්සුමේ ශේෂය පදනම් කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති අතර ACA- 5 ආකෘතිය සඳහා තොරතුරු භාණ්ඩාගාර මුද්‍රිත අනුව සකස්කර ඇත. |

**1.6.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7 වන ඡේදයේ (vi ) වගන්තිය පරිදි අක්මුදල් ගැලපුම් ගිණුම සකස් කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ සිට අග්‍රිම සැසඳුම් ගිණුම් ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.. |
| (ආ) | මූල්‍ය කාර්යසාධන වාර්තාවට වෙනත් මූලාශ්‍ර ලැබීම් ඇතුළත් නොකළ යුතු වුවද, රු.17,072,556 ක් වූ වෙනත් මූලාශ්‍ර ලැබීම් එම වාර්තාවේ ඇතුළත් කර තිබුණි. | -එම- | 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම ලැබීම් වෙන් වෙන්ව ඇතුලත් කිරීමට පියවර ගනු ලැබේ. |
| (ඇ) | ආදායම් නොවන ලැබීම් රු.10,085,025 ක් මූල්‍ය කාර්සාධන ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | -එම- | 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ආදායම් නොවන ලැබීම් අදාල ස්ථානයේම ඇතුලත් කිරීමට පියවර ගනු ලැබේ. |
| (ඈ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.79,927,923 ක් වූ නමුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ 5) වර්ෂය තුළ මිලදී ගැනීම් ලෙස රු.5,884,363 ක් පමණක් ඇතුළත් කර තිබුණි. මේ නිසා එම ප්‍රකාශ අතර රු.74,043,560 ක වෙනසක් නිරීක්ෂණය විය.තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම වියදම රු.12,976,069 ක් වී තිබුණි. | -එම- | මෙම දෙපාර්තමේන්තුව මගින් අත්පත් කර ගනු ලැබූ මූලධන වත්කම් පමණක් මෙම ආකෘතියේ දත්ත වලින් නිරූපනය වේ. නමුත් ඉදිකිරීම් කටයුතු සියල්ලම හා අනෙකුත් මිලදී ගැනීම්ද ප්‍රතිපාදන නිදහස් කිරීම මගින් බාහිර ආයතන මගින් සිදු කරනු ලබන අතර මෙම අඩුවෙන් සටහන් කර තිබූ යැයි සඳහන් වන අගයන් එසේ ප්‍රතිපාදන නිදහස් කර ඉදිකිරීම් කල හා මිලදී ගනු ලැබූ මූලධන වත්කම් වේ. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු.212,500 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ආදායම් නොවන ලැබීම් නිවැරදිව ගැලපුම් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කළ යුතු බව. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී පැමිණි නිලධාරියකුගේ ණය ශේෂ නිරවුල් කිරීමක් වැරදීමකින් මෙම දෙපාර්තමේන්තු ශීර්ෂයට සටහන් කර ඇති අතර එම ශේෂය වූ රු.212,500 එම අවස්ථාවේදීම නිවැරදි කල බැවින් එම වැරදි නිවැරදි කිරීම් අගය එම වෙනසට හේතුවී ඇත. |
| (ආ) | ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් වර්ෂය තුළ රු.228,613,687 ක් වැයකර තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.248,246,500 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් රු.19,632,813 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | එම වෙනස අත්තිකාරම් B ගිණුමට අදාල වියදම් වන අතර එම අගයද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් වියදම් යටතේ දක්වා ඇත. ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුළ අත්තිකාරම් බී ගිණුම යටතේ අයකරගෙන තිබූ රු.22,473,337 ක් සහ අත්තිකාරම් ගෙවීම් ප්‍රමාණය වූ රු.19,845,313 ක් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ජනිතවූ මුදල් ප්‍රවාහයන් සහ වැයවූ මුදල් ප්‍රවාහයන් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | -එම- | ඉදිරියේ දී නියමිත ආකෘතියට අනුවම තොරතුරු සටහන් කිරීමට පියවර ගන්නා බව දක්වා තිබුණි.. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරියා විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලොචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 50 (ආ) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙළ කිරීම ගණන් දීමේ නිළධාරීගේ වගකීම වුවත්, දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 44කට අදාළව සළසා තිබුණු රු.265,363,770 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.91,856,497 ක් ඉතිරිකර තිබුණු අතර එය ශුද්ධ | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි හා යථා යෝග්‍ය වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | දෙපාර්තමේන්තුවට බලපාන පරිපාලන හේතුන් හා විවිධ හේතුන් මත මෙහි සඳහන් කල වැය විෂයන්වල ඉතිරිවීම් සිදු වී ඇති බව පිළිගන්නා අතර ඉදිරියේදී මෙම ඉතිරිවීම්ද අවම වන පරිදි කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදනයෙන් සියයට 34.6 ක් වී තිබුණි. | | |
| (ආ) | මුදල් රෙගුලාසි 66 යටතේ පුනරාවර්තන වැය විෂයන් 09 කට හා ප්‍රාග්ධන වැය විෂයකට මාරු කරන ලද ප්‍රමාණයන්ගෙන් අවස්ථා 08 ක දී ඉතිරිවීම් මාරු කළ මුදලින් සියයට 8 සිට සියයට 82 දක්වා පරාසයක විය. | අත්‍යාවශ්‍ය වියදම් සඳහා පමණක් මු.රෙ.66 යටතේ මාරුකිරීම් සිදු කිරීමට හා අදාල වියදම් දැරීමට කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ හා වෘත්තීය පුහුණු ආයතන වල අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විටකදී අනෙකුත් වැය විෂයයන්වල ප්‍රතිපාදන යටපත් කරමින් මු.රෙ.66 ප්‍රතිපාදන මාරු කිරීම් මගින් ප්‍රතිපාදන සොයා ගැනීමට සිදු වූ බව. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------------------- |
| (අ) | මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව බැදීම් ඇතිකර ගැනීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන පවතින බව තහවුරු කරගත යුතුවේ. කෙසේවුවද, දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 05 ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.2,458,932 ක් වූ බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව. | ඇස්තමේන්තුගත පරිදි ප්‍රතිපාදන නොලැබුනද අත්‍යවශ්‍ය වියදම් දැරීම සිදු කල යුතුව තිබේ. විශේෂයෙන් ආබාධිත දරුවන් සිටින ආයතනවල අඛණ්ඩව කාර්යයන් සිදුකල යුතුය. එහෙයින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සිදුව තිබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 18 ක් වෙනුවෙන් එකතු වටිනාකම රු.2,944,805 ක් වූ බැරකම් හා බැදීම් බැරකම් ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂය අවසානයට සියළු බැරකම් නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කළ යුතු වීම. | 2019 වර්ෂයේ ගෙවීමට නොහැකිවූ වියදම් 2020 වර්ෂයේ පෙබරවාරි 15 දිනට ප්‍රථම ගෙවිය යුතු වූවත් ඒ වන විට සිගාස් වැඩ සටහනට ඇතුළත් කළ බැරකම් පමණක් මූල්‍ය පුකාශන වල ඇතුළත් කරන ලදි. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳීම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය සහ සේවය හැරගිය නිලධාරින් 09 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු.413,320 ක් වූ අතර එයින් රු.158,844 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතිණි. | අත්තිකාරම් ගිණුම යටතේ නිලධාරීන්ගෙන් අයකර යුතු ශේෂ හැකි ඉක්මණින් නිරවුල් කර ගැනීමට කටයුතු කර යුතු වීම. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මත් නිවාරණ හා පුනරුත්ථාපන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2 ක් ප්‍රතිපාදනය කර තිබුණද ඒ සඳහා වූ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක නොකිරීම නිසා වෙන්කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිව පැවතිණි. | සැළසුම් සකස් කිරීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීමටද කටයුතු කළ යුතු බව. | වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සඳහා අනුමැතිය ලබා නොදීම හා ව්‍යාපෘති වාර්තාවල පැවති අඩුපාඩු හේතුවෙන් සැළසුම් කල වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ සමාජසේවා දෙපාර්තමේන්තුවට අයත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 07 ක් සඳහා සිසුන් 467 දෙනෙකු බඳවාගෙන තිබුණු නමුත් වර්ෂ අවසානයේ පාඨමාලා අවසන් කර විභාගයවලට පෙනී නොසිටි සිසුන් සංඛ්‍යාව 185 ක් වී තිබුණි. මේ අතුරින් මධ්‍යස්ථාන 3 ක විභාගවලට පෙනී නොසිට පාඨමාලා හැරගිය සංඛ්‍යාව සියයට 50 කට වැඩිවී තිබුණි. මෙසේ පාඨමාලා හැරයාම සඳහා වන හේතු සමාලෝචනය කර ඔවුන් රඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අභ්‍යාසලාභීන්ට හා සමාජයට වැදගත්වන පරිදි පාඨමාලාව සකස් කළ යුතු බව. | වර්ෂය ආරම්භයේදී අභ්‍යාසලාභීන් බඳවාගත් නමුත් නිවාඩු කාලවලදී නිවෙස්වලට යාමෙන් පසු ඇතැම් අභ්‍යාසලාභීන් නැවත පැමිණ නොතිබුණි. . ඉදිරියේදී අභ්‍යාසලාභීන්ගේ සහභාගිත්වය සක්‍රිය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | අදහස් ගණන්දීමේ නිලධාරීගේ දැක්වීම |
| --- | --- | --- |
| කිලිනොච්චියේ සහ මඩකළපුවේ අලුතෙන් ඉදිකරන ලද වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල නේවාසිකාගාර ඉදිකර අවසන් කර තිබුණද මුළුතැන්ගෙවල් ඉදිකර නොමැතිවීම හේතුවෙන් නේවාසික පුහුණු කටයුතු සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කළ නොහැකිව තිබුණි. මෙම මධ්‍යස්ථාන දෙකෙහි නේවාසික නොවන පුහුණු කටයුතු සඳහා 2020 වර්ෂයට සිසුන් 50 බැගින් 100 දෙනෙකු තෝරා ගෙන තිබුණද, උපදේශකවරුන් බඳවා ගැනීමට නොහැකිවීම නිසා 2020 දෙසැම්බර් 15 දක්වාම පුහුණු කටයුතු ආරම්භ කළ නොහැකිව පැවතුණි. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි ඉදිකිරීම් සැළසුම් කිරීම හා උපදේශකවරුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු බව | ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන ඉදිකිරීම් කටයුතු සිදුකළ යුතු අතර පුහුණු අංශ සඳහා උපදේශකවරු බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2019 ඔක්තෝබර් 07 දින ලිපි යොමුකර ඇතත් මේ දක්වා අනුමැතිය ලැබී නොමැත. |

## 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දැක්වීම ගණන්දීමේ නිලධාරීගේ අදහස් |
| --- | --- | --- |
| කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සිදුකරන ලද පුවක්පිටිය මන්ද මානසික කාන්තා රැකවරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ පළමු අදියර සඳහා 2018 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දිනට රු.44,775,816 ක් වැයකර තිබුණි. මෙම ඉදිකිරීමේ පළමු අදියර අවසන්වුවද, ජල ටැංකිය, මුළුතැන්ගෙය, ආරක්ෂිත තාප්පය ලිඳ සහ අකුණු ආරක්ෂිත පද්ධතිය ඉදිකිරීම දෙවන අදියරට ඇතුළත් කර තිබීමේ හේතුවෙන් පළමු ඉදිකිරීම් ප්‍රයෝජනයට ගත නොහැකිව නිශ්කාර්යය වත්කමක් ලෙස පැවතිණි. | ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනයට කටයුතු කළ යුතු වීම. | මෙහි භූමිය පරික්ෂා කර වාර්තාවක් ලබාගැනීමට ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත භාරදී තිබූ නමුත් ඒ සඳහා වැඩි කාලයක් ගතවීම නිසාත් පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු 2019 ඔක්තෝබර් 31 දිනට අවසන් වුවද යම්යම් අඩුපාඩු පැවතීම හේතුවෙන් ගොඩනැගිල්ල බාරගැනීමට ප්‍රමාදවීමත් නිසා 2020 ජුනි 15 දින දක්වා ප්‍රමාද විය. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුළුතැන්ගෙය ඉදිකිරීම සඳහා ඉදිරිපත් කරන ලද සැළැස්ම වෙනුවෙන් 2019 ජුනි මාසයේ රු.මිලියන 28 ක් ලබාදී ඇත. 2019 වර්ෂයේ ප්‍රමාණවත් කාලයක් නොමැතිවූ බැවින් අදාල |

| | | |
|---|---|---|
| | | කාර්යය සිදුකිරීමට නොහැකි බව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරයා දැනුම් දී ඇත. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට මෙම දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ඉඩම් අක්කර 50.93 ක් වූ ඉඩම් කොටස් 11 ක් ලැබී තිබුණු අතර එයින් අක්කර 24.27 ක් වූ ඉඩම් කොටස් 08 ක අයිතිය විධිමත් ලෙස පවරාගැනීමට නොහැකිවී තිබුණි. එසේම දෙපාර්තමේන්තුවට 2013 වර්ෂයේ තෑගි ඔප්පුවක් මගින් ලැබී තිබුණු නුවරඑළිය දෙහිගොල්ල ඉඩම සහ නිවස නිශ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තුව අයත් ඉඩම්වල අයිතිය විධිමත්ව පවරා ගැනීමට සහ ඒවා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වීම. | සමාජසේවා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ඉඩම් 15 න් ඉඩම් 03 ක් පවරා ගැනීම සහ අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර ඇත. එසේම නුවරඑළිය දෙහිගොල්ල ඉඩම ප්‍රයෝජනයට ගැනීමට ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන ලෙස දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරියා වෙත දැනුම් දී ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 104 ක් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම පුරප්පාඩු සංඛ්‍යාව 110 දක්වා වැඩිවී තිබුණි. එම පුරප්පාඩු වලින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් 2018 දෙසැම්බර් මාසයේ සිට 2020 ඔක්තෝබර් මාසය දක්වා ඉල්ලීම් කර තිබුණද, 2020 නොවැම්බර් මාසය දක්වාම බඳවා ගැනීම සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවය මත පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි |

| | | | |
|---|---|---|---|
| (ආ) | ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 86 න් වෘත්තිය උපදේශකවරු 13 ක්ද, නිවාස පාලක තනතුරු 05 ක්ද සහ සංඥා භාෂා පරිවර්තක තනතුරු 20 ක් බඳවාගැනීමට දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් 2019 මාර්තු 19 සහ 2019 අප්‍රේල් 10 දින ඉල්ලීම් සිදුකර තිබුණද, 2020 නොවැම්බර් මාසය දක්වාම බඳවා ගැනීම සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවය මත පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකළ යුතුය | අදහස් දක්වා නොතිබුණි |